සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

| | | |
|---|---|---|
| පළමු වාර පරීක්ෂණය | 2018 | 9 ශ්‍රේණිය |
| முதலாம் தவணைப் பரீட்சை | 2018 | தரம் 9 |
| **First Term Test** | **2018** | **Grade 9** |

| | |
|---|---|
| *නාට්‍ය හා රංග කලාව - I,II* | *පැය දෙකයි* |
| ***Drama and Theatre - I,II*** | ***Two Hour*** |

**නම/විභාග අංකය :- ..........................................................................................................**

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට අදාළ පිළිතුර හිස්තැන මත ලියන්න.**

01. කදාවළලු නාට්‍ය රචනා කර ඇත්තේ ................................................ ජාතකය ඇසුරිනි.

02. ...................................... හා ....................................... කදාවළලු නාට්‍යයේ එන වෙළෙඳ චරිත ද්විත්වය වේ.

03. නළුවා තම පෞද්ගලිකත්වයෙන් මිදී යම් චරිතයකට ප්‍රවේශ වීම ......................................... නම් වේ.

04. නාට්‍ය සංගීතය .................................................... අභිනයට අයත් වේ.

05. යම් ක්‍රියාවක් හෝ අවස්ථාවක් ඒ අයුරින්ම කර පෙන්වීම .................................... නම් වේ.

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

06. **නාට්‍යක ගැටුම් පවතින්නේ,**

1. නළු නිළියන් අතර ය.
2. නළුවා සහ ප්‍රේක්ෂකයින් අතර ය.
3. චරිත අතර ප්‍රතිවිරුද්ධ අදහස් තුළ ය.
4. අධ්‍යක්ෂක හා ආනුෂංගික ශිල්පීන් අතර ය.

07. නාට්‍ය ශෛලිය ප්‍රධාන ලෙස කොටස්

1. 2 යි.
2. 4 යි.
3. 3 යි.
4. 5 යි.

08. වලහා සහ මාෂා නාට්‍යයේ මාෂා තුළ ඇති දුර්ගුණයක් මතු වන අවස්ථාව වන්නේ,

1. මී මැස්සන්ගෙන් උදව් ලබා ගැනීම.
2. සමනලයන්ගේ අත්තටු කැඩීම.
3. මිතුරන් සමඟ ඇවිදින්නට යාම.
4. වලහාගේ නිවසට යාම.

09. ජාතක කතාවක් ඇසුරින් නිර්මාණය වූ නාට්‍යයක් නොවන්නේ

1. මනමේ නාට්‍ය යි.
2. සිංහ බාහු නාට්‍ය යි.
3. වෙස්සන්තර නාට්‍ය යි.
4. මහාසාර නාට්‍ය යි.

10. නාට්‍යක තේමාව යනු,

1. නාට්‍යයේ නමයි යි.
2. නාට්‍යයේ ශෛලිය යි.
3. චරිත නිරූපනය යි.
4. නාට්‍යයෙන් මතුවන ප්‍රධාන අදහස යි.

- **11 සිට 15 දක්වා ප්‍රශ්න වලට ඡයාරූපය ඇසුරින් පිළිතුරු සපයන්න.**

11. මෙම ඡයාරූපයේ සිටින නාට්‍යවේදිනිය වන්නේ,



    1. මැණිකේ අත්තනායක ය.
    2. සෝමලතා සුබසිංහ ය.
    3. මානෙල් ජයසේන ය.
    4. කෞෂල්‍යා ප්‍රනාන්දු ය.

12. මෙම ඡායාරූපය අයත් නාට්‍යය වන්නේ,



    1. පුංචි අපට දැන් තේරෙයි.
    2. වලහා සහ මාෂා
    3. නරි බෑණා
    4. කැළණි පාලම

13. මෙම රූපය අයත් රංග විශේෂය වන්නේ,



    1. අභිරූපන
    2. ඔපෙරා
    3. මුද්‍රා නාට්‍ය
    4. බැලේ

14. මෙම නාට්‍යයේ නිර්මාතෘවරයා වන්නේ,



    1. එදිරිවීර සරත්චන්ද්‍ර මහතා
    2. ජයලත් මනෝරත්න මහතා
    3. හෙන්රි ජයසේන මහතා
    4. බන්ධුල ජයවර්ධන මහතා

15. මෙම නාට්‍ය අයත් නාට්‍ය විශේෂය වන්නේ,



    1. ගුවන් විදුලි නාට්‍යය කි.
    2. වීදි නාට්‍යය කි.
    3. ළමා නාට්‍යය කි.
    4. ටෙලි නාට්‍යය කි.

- 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

16. චරිතයක ඇති විවිධ පැතිකඩ .................................................... ලෙස හඳුන්ව යි.

17. නාට්‍ය පිටපතෙහි රංගනය සඳහා ලබා දී ඇති උපදෙස් .......................................... නම් වේ.

18. වේෂ භූෂණ හා රංගභූමි අලංකරණය ........................................... අයත් වේ.

19. නළුවා යම් චරිතයක් රඟපෑම ........................................... ලෙස හැඳින් වේ.

20. වේදිකා නාට්‍යක ඇති සුවිශේෂී ලක්ෂණයක් වන්නේ .................................... ... යි.

( රංගවිධාන , ආහාර්ය අභිනය , සජීවී බව , භූමිකා , රූපණය )

## II කොටස

- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

01. අතට වළලුද පයට ගිගිරිද
ලා ගනී කිඳු රඟන සොබනා
වනේ සිදඹුවො කඩා මල් පෙති
වරල සරසා ගනිත් නිතිනා

I. මෙම ගීතය අයත් නාට්‍ය කුමක්ද? (ල.02)
II. මෙහි එන චරිත හතරක් නම් කරන්න. (ල.02)
III. මෙම නාට්‍ය යේ නිෂ්පාදකවරයා කවුරුන්ද? (ල.02)
IV. මෙම නාට්‍යයේ බෝධිසත්ව චරිතය කුමන නමකින් හැඳින්වේද? (ල.02)
V. නාට්‍යයෙන් මතු කෙරෙන ප්‍රධාන තේමාව කුමක්ද? (ල.02)

02.
I. නාට්‍යෝපකරණ යනු කුමක්ද? (ල.02)
II. නාට්‍යෝපකරණ නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් නම් කරන්න. (ල.02)
III. ඔබ කැමති නාට්‍යෝපකරණ දෙකක් ඇඳ එක් උපකරණයක් සකස්කර ගන්නා ආකාරය විස්තර කරන්න. (ල.06)

03.
I. ආනුෂංගික කලා යන්න හඳුන්වන්න. (ල.02)
II. ආනුෂංගික කලා හතරක් නම් කරන්න. (ල.04)
III. එක් ආනුෂංගික කලාවක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ල.04)

04.
I. නාට්‍ය පෙළ යනු කුමක්ද? (ල.02)

II. නාට්‍ය පෙළක දක්නට ලැබෙන ලක්ෂණ තුනක් ලියා දක්වන්න. (ල.03)

III. දී ඇති නාට්‍ය අතරින් එකක් තෝරාගෙන පහත වගුව සම්පූර්ණ කරන්න. (ල.05)
වලහා සහ මාෂා
පුංචි අපට දැන් තේරෙයි
අමර ගියා දිව්‍ය ලෝකෙ

| | |
|---|---|
| නාට්‍යයේ නම | |
| චරිත | |
| ස්ථාන | |
| කතා සාරාංශය | |
| මූල බීජය | |
| තේමාව | |

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

| | | |
|---|---|---|
| **පළමු වාර පරීක්ෂණය** | **2018** | **9 ශ්‍රේණිය** |
| **முதலாம் தவணைப் பரீட்சை** | **2018** | **தரம் 9** |
| **First Term Test** | **2018** | **Grade 9** |

***නාට්‍ය හා රංග කලාව***
***Drama and Theatre***

***ප්‍රයෝගික පරීක්ෂණය***
***Practical***

01. වාක්‍යක් හෝ වචනයක් අර්ථ තුනක් මතුවන සේ පැවසීම. (ල.10)

02. කතාන්දරයක් නාට්‍යානුසාරීව දේශ නාට්‍ය පිටපතේ චරිතයක් නිරූපණය කිරීම. (ල.10)

03. නාට්‍ය ගීතය ගායනය හා රංගනය (ල.10)

04. ගුරුවරයා ලබා දෙන මාතෘකාවකට අදාළව ක්ෂණික නිරූපණයක් ඉදිරිපත් කිරීම. (ල.10)

05. ඉදිරිපත් කිරීම. . (ල.10)